# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## මවුන්ට් කාමෙල් අධ්‍යාපනික ආයතනය
## (සංස්ථාගත කිරීමේ)

**මවුන්ට් කාමෙල් අධ්‍යාපනික ආයතනය සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.**

---

මාතර දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු බුද්ධික පතිරණ මහතා විසින්
2016 ජනවාරි මස 27 වන දින ඉදිරිපත් කරන ලදී.

(ගැසට් පත්‍රයේ පළ කළේ 2015 දෙසැම්බර් මස 14 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී.

---

[71 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

**මිළ : රු. 8.00 යි.** **තැපැල් ගාස්තුව : රු. 10.00 යි.**

## මවුන්ට් කාමෙල් අධ්‍යාපනික ආයතනය
## (සංස්ථාගත කිරීමේ)

## මවුන්ට් කාමෙල් අධ්‍යාපනික ආයතනය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

පූර්විකාව.

“මවුන්ට් කාමෙල් අධ්‍යාපනික ආයතනය” යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන ආයතනයක්, ඒ ආයතනයේ පරමාර්ථ සහ ඒ ආයතනයට සම්බන්ධ සියලු කාරණා ඒ ආයතනයේ සාමාජිකයන් එකඟ වූ රීතිවලට අනුකූලව සාර්ථක ලෙස ඉෂ්ට කිරීම සඳහා ශ්‍රී ලංකාවේ පිහිටුවා තිබූ හෙයින් ද:

එකී ආයතනය පිහිටුවනු ලැබුවේ කවර පරමාර්ථ සහ කාරණා පෙරදැරි කොට ගෙන ද ඒ පරමාර්ථ සහ කාරණා මෙතෙක් කල් ඒ ආයතනය විසින් සාර්ථක ලෙස ඉටු කොට සහ ක්‍රියාත්මක කොට ඇති හෙයින් සහ ඒ ආයතනය සංස්ථාගත කිරීමට ඉල්ලුම් කොට ඇති හෙයින් ද ඒ ඉල්ලීම ඉෂ්ට කිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

ලුහුඬු නාමය.

1. මේ පනත 2016 අංක     දරන මවුන්ට් කාමෙල් අධ්‍යාපනික ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

මවුන්ට් කාමෙල් අධ්‍යාපනික ආයතනය සංස්ථාගත කිරීම.

2. (මෙහි මින් මතු “ආයතනය” යනුවෙන් සඳහන් කරනු ලබන) මවුන්ට් කාමෙල් අධ්‍යාපනික ආයතනයේ සාමාජිකයන් වශයෙන් දැනට සිටින තාක් තැනැත්තන් සහ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට මින් මතු ඇතුළත් කර ගනු ලබන සාමාජිකයන්, මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට සහ ඉන්පසු “මවුන්ට් කාමෙල් අධ්‍යාපනික ආයතනය” යන නාමය සහ අභිධානය යටතේ (මෙහි මින් මතු “සංස්ථාව” යනුවෙන් සඳහන් කරනු ලබන) අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් බවට පත්වන්නේ ය. තව ද, එකී නාමයෙන් ඒ සංස්ථාව විසින් ද ඊට විරුද්ධව ද සියලු අධිකරණවල නඩු පවරනු ලැබිය හැකි අතර, පොදු මුද්‍රාවක් තබා ගැනීමේ ද, එය පාවිච්චි කිරීමේ ද, ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද, පූර්ණ බලය සහ අධිකාරය ඒ සංස්ථාවට ඇත්තේ ය.

සංස්ථාවේ පොදු පරමාර්ථ.

3. සංස්ථාව පිහිටුවනු ලබන්නේ කවර පරමාර්ථ සඳහා ද ඒ පරමාර්ථ පහත දැක්වෙන පරිදි විය යුතු යැයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ:—

(අ) ගුරුවරුන් සමග විධිමත් සන්නිවේදනයක් පැවැත්වීම සහ උපදෙස් සහ සහයෝගය අවශ්‍යවූවන්ට උදව් කරමින් ඔවුන්ගේ සාධාරණ අවශ්‍යතාවලට සහ අපේක්ෂාවලට ප්‍රතිචාර දැක්වීම;

(ආ) සුදුසුකම් සහ අත්දැකීම්වලින් යුත් විභාග පරීක්ෂක මණ්ඩලයක් බඳවාගෙන ඔවුන්ට පුහුණුව ලබා දී පවත්වාගෙන යාම සහ ආයතනය විසින් නිර්දේශිත විෂය ක්ෂේත්‍රයට අදාළව පරීක්ෂණ පැවැත්වීම;

(ඇ) කාර්යක්ෂමව, සාධාරණ අන්දමින් විභාග පවත්වා කඩිනමින් ප්‍රතිඵල නිකුත් කිරීම;

(ඈ) ආයතනයේ ආචාර්ය මණ්ඩලයේ සාමාජිකයන්ට ඉතාම විශිෂ්ට පුහුණුවක් ලබා දීම;

(ඉ) ඉංග්‍රීසි භාෂාව පිළිබඳව පුළුල් සුදුසුකම් ලබා දීම සහ ළමුන්ගේ සහ වැඩිහිටියන්ගේ ඉංග්‍රීසි භාෂාව පිළිබඳව ඇති අවබෝධය වැඩි දියුණු කිරීම සහ විශ්වාසයෙන් යුතුව ලොවට මුහුණ දිය හැකි වන පරිදි ඔවුන්ගේ සන්නිවේදන ශක්තිය උසස් කිරීම ; සහ

(ඊ) ඉහත සඳහන් පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීමෙහි ලා හිතකර හෝ ආනුෂංගික වෙනත් සියලු ක්‍රියා සහ දේ සිදු කිරීම.

සංස්ථාවේ බලතල.

4. මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව පහත දැක්වෙන දෑ කිරීමට බලය සංස්ථාවට ඇත්තේ ය:—

(අ) සංස්ථාවේ කාර්ය සඳහා අවශ්‍ය වන යම් නිශ්චල හෝ චංචල දේපළක් මිලයට ගැනීම, අත්කර ගැනීම, දැරීම, බද්දට හෝ කුලියට ගැනීම හෝ දීම, උකස් කිරීම, ඔඩපනය

කිරීම, විකිණීම, හුවමාරු කිරීම හෝ වෙනත් යම් ආකාරයකින් නීයාදනය කිරීම, බැඳීමකට යටත් කිරීම හෝ බැහැර කිරීම;

(ආ) සංස්ථාවේ පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීම සඳහා හෝ බලතල ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වන සියලු ගිවිසුම්වලට හෝ කොන්ත්‍රාත්තුවලට, කෙළින්ම හෝ සංස්ථාව විසින් බලය පවරනු ලැබූ සංස්ථාවේ යම් නිලධරයකු හෝ නියෝජිතයකු මාර්ගයෙන් ඇතුළත්වීම, ඒවා ඉටු කිරීම හෝ ක්‍රියාත්මක කිරීම;

(ඇ) මුදලින් හෝ ද්‍රව්‍යවලින්, ත්‍යාග, පරිත්‍යාග සහ රික්තවරණ භාර ගැනීම;

(ඈ) ස්වකීය අරමුදල් ආයෝජනය කිරීම, භාර ඇති කිරීම සහ පරිපාලනය කිරීම සහ යම් බැංකුවක ජංගම, තැන්පතු සහ ඉතිරි කිරීමේ ගිණුම් පවත්වාගෙන යෑම;

(ඉ) පොත්, වාර ප්‍රකාශන, සඟරා සහ වෙනත් ලිපිලේඛන ප්‍රසිද්ධ කිරීම හෝ ප්‍රසිද්ධ කිරීමට කටයුතු යෙදීම සහ පුස්තකාල, පොත් සාප්පු සහ මුද්‍රණාල පිහිටුවීම සහ පවත්වාගෙන යෑම;

(ඊ) සංස්ථාවේ කාර්ය සඳහා අවශ්‍ය වන මුදල් සුදුසු යයි සංස්ථාව විසින් අදහස් කරනු ලබන ආකාරයකට සහ එසේ සුදුසු යයි සලකනු ලබන ඇප මත මුදල් අත්තිකාරම් දීම හෝ ණයට දීම හෝ ණයට ගැනීම;

(උ) සංස්ථාවේ සාමාජිකත්වය, සාමාජිකත්වයට ඇතුළත් කර ගැනීම සහ සංස්ථාව විසින් නැතහොත් සංස්ථාව වෙනුවෙන් පවත්වනු ලබන පාඨමාලාවලට සහ විභාගවලට ඇතුළත් කර ගැනීම සම්බන්ධයෙන් ගාස්තු, දායක මුදල් සහ සම්මාදම් මුදල් පනවා අයකර ගැනීම;

(ඌ) සංස්ථාවේ පරමාර්ථ ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වන නිලධරයන්, ආචාර්යවරුන්, සහ සේවකයන් පත් කිරීම, සේවයේ යෙදවීම, මාරු කිරීම, ඔවුන් විෂයෙහි විනය

පාලනය පවත්වාගෙන යාම, ඔවුන් සේවයෙන් පහකිරීම සහ ඔවුන්ගේ සේවා නියමයන් හා සේවා කොන්දේසි නියම කිරීම;

(එ) ඉංග්‍රීසි භාෂාව කථා කිරීම, ලිවීම හා ප්‍රසාංගික කලාව ආශ්‍රිතව පවත්වනු ලබන විභාග සඳහා විෂය නිර්දේශ සැපයීම; සහ

(ඒ) සංස්ථාවේ පරමාර්ථ සියල්ලම හෝ ඉන් කිසිවක් ඉෂ්ට කිරීම හෝ ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය හෝ යෝග්‍ය සියලු ක්‍රියා, කාරණා සහ දේ මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව සිදු කිරීම සහ ක්‍රියාත්මක කිරීම.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

**5.** (1) සංස්ථාවේ කටයුතු, සංස්ථාවේ රීති අනුව තෝරාගනු ලබන සභාපති, උප සභාපති, ලේකම්, භාණ්ඩාගාරික සහ තවත් සාමාජිකයන් දෙදෙනකුගෙන් සමන්විත වූ අධ්‍යක්ෂ මණ්ඩලයක් විසින් මෙම පනතේ විධිවිධානවලට යටත්ව පරිපාලනය කරනු ලැබිය යුතු ය.

(2) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භවන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී ආයතනයේ ධුර දැරුවා වූ අධ්‍යක්ෂ මණ්ඩලය, සංස්ථාවේ ප්‍රථම අධ්‍යක්ෂ මණ්ඩලය විය යුතු අතර, මෙම මණ්ඩලය මෙම පනතේ රීතිවලට යටත්ව නව අධ්‍යක්ෂ මණ්ඩලයක් පත්කරන තෙක් ධුර දැරිය යුත්තේ ය.

සංස්ථාවේ රීති.

**6.** (1) සංස්ථාව විසින් කලින් කල සාමාජිකයන්ගේ මහා සභා රැස්වීමක දී පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු බහුතරයකින් පහත දැක්වෙන කාරණා සියල්ලම හෝ ඉන් යමක් සඳහා මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන රීති සෑදීම නීත්‍යනුකූල විය යුතු ය:—

(අ) සාමාජිකයන් වර්ග කිරීම, ඇතුළත් කර ගැනීම, ඔවුන්ගේ ඉල්ලා අස්වීම හෝ සාමාජිකත්වයෙන් ඔවුන් නෙරපීම;

(ආ) සංස්ථාවේ ධුර දරන්නන් තෝරා පත් කර ගැනීම, ඔවුන්ගේ ඉල්ලා අස්වීම හෝ ධුරය අත්හැර යාම හෝ ඔවුන් ධුරයෙන් නෙරපීම සහ ඔවුන්ගේ බලතල චර්යාව සහ කර්තව්‍ය ;

(ඇ) සංස්ථාවේ විවිධ නිලධරයන්ගේ, නියෝජිතයන්ගේ සේවකයන්ගේ බලතල, චර්යාව, කාර්ය සහ කර්තව්‍ය;

(ඈ) සංස්ථාවේ සහ අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීම් කැඳවීමේ දී සහ පැවැත්වීමේ දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය, රැස්වීම් පවත්වන වේලාවන්, ස්ථාන සහ රැස්වීම් පිළිබඳ දැන්වීම්, න්‍යාය පත්‍ර සහ රැස්වීම්වල ගණපූරණය සහ ඒ රැස්වීම්වල කටයුතු පවත්වාගෙන යාම; සහ

(ඉ) සංස්ථාවේ කටයුතු පරිපාලනය කිරීම, කළමනාකරණය කිරීම හා එහි අරමුණු ඉටු කර ගැනීම.

(2) (1) වන උපවගන්තිය යටතේ, යම් රීතියක් සාදනු ලැබිය හැකි ආකාරයෙන්ම එවැනිම රැස්වීමක දී සංස්ථාවේ යම් රීතියක් සංශෝධනය කිරීම, වෙනස් කිරීම, ඊට යමක් එකතු කිරීම හෝ පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.

(3) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේදී ම ආයතනයේ බලපැවැත් වූ රීති මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන තාක් දුරට මේ වගන්තිය යටතේ, සාදනු ලැබූ රීති ලෙස සලකනු ලැබිය යුතු ය.

(4) සංස්ථාවේ සියලුම සාමාජිකයන් සංස්ථාවේ තත්කාලයේ බලපවත්නා රීතිවලට යටත් විය යුතු ය.

7. (1) සංස්ථාවට එහිම අරමුදලක් තිබිය යුතු ය. ත්‍යාග, රික්තවරණ, පරිත්‍යාග, පැවැරුම්, ග්‍රාහක මුදල්, දායක මුදල් හෝ ගාස්තු අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කරනු ලබන පරිදි, එක් බැංකුවක හෝ බැංකු වැඩි ගණනාවක සංස්ථාවේ බැරට තැන්පත් කරනු ලැබිය යුතු ය. සංස්ථාවේ අරමුදල.

(2) මේ පනත යටතේ සංස්ථාව සතු බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කරගෙන යාමේ දී, ඉටු කිරීමේ දී හා කිරීමේ දී සංස්ථාව

විසින් දරන ලද යම් වියදමක් පියවීමට අවශ්‍ය සියලු මුදල් සංස්ථාවේ අරමුදලින් ගෙවනු ලැබිය හැකි ය.

ගිණුම් හා විගණනය.

8. (1) සංස්ථාවට ලැබුණු සහ සංස්ථාව විසින් වියදම් කරනු ලැබූ සියලුම මුදල් පිළිබඳව නිසි අයුරින් ගිණුම් තැබීමට සංස්ථාව විසින් සැලැස්විය යුතු ය.

(2) සංස්ථාව විසින් පත්කරන ලද විගණකවරයකු හෝ විගණකවරයන් විසින් යටත් පිරිසෙයින් වර්ෂයකට එක් වරක් හෝ සංස්ථාවේ ගිණුම් පරීක්ෂාකොට විගණනය කළ යුතු අතර, ආදායම් සහ වියදම් ගිණුමෙහි සහ ශේෂ පත්‍රයෙහි නිරවද්‍යතාව ඔහු හෝ ඔවුන් විසින් සහතික කළ යුතු ය.

ආයතනය විසින් සහ ආයතනයට ගෙවිය යුතු ණය.

9. මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුවම වූ දිනයෙහි ආයතනයේ පැවති සියලු ණය සහ බැරකම් මෙයින් සංස්ථාපනය කරනු ලැබූ සංස්ථාව විසින් ගෙවා නිදහස් කළ යුතු අතර එදිනට ආයතනයට ගෙවිය යුතු ග්‍රාහක මුදල් සහ දායක මුදල් මේ පනතේ කාර්ය සඳහා සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය.

සංස්ථාව විසින් චංචල හෝ නිශ්චල දේපළ දැරිය හැකි බව.

10. යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, තෑගි කිරීමක්, තෙස්තමේන්තු නියාදනයකින් දේපළ බැහැර කිරීමක් ප්‍රකාර හෝ වෙනත් ආකාරයකින් සංස්ථාව සතුවන යම් චංචල හෝ නිශ්චල දේපළක් අත්කර ගැනීමට හා දැරීමට නීතියෙන් සංස්ථාවට බලය හා හැකියාව ඇති අතර, එවැනි සියලු දේපළ සංස්ථාවේ තත්කාලීනව බලපවත්නා රීතිවලට යටත්ව, මේ පනතේ කාර්ය සඳහා ඒ දේපළ විකිණීමේ, උකස් කිරීමේ, බදු දීමේ, හුවමාරු කිරීමේ හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීමේ පූර්ණ බලය ඇතිව සංස්ථාව විසින් දැරිය යුතු ය.

සංස්ථාවේ මුද්‍රාව.

11. සංස්ථාවේ මුද්‍රාව අධ්‍යක්ෂ මණ්ඩලය භාරයේ තිබිය යුතු ය. අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයකු සහ ලේකම්වරයා හෝ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යථා පරිදි බලය දෙනු ලැබූ යම් තැනැත්තකු ඉදිරිපිට දී හැර සංස්ථාවේ මුද්‍රාව කවර වූ හෝ සාධන පත්‍රයකට නොතැබිය යුතු අතර, තමන් පැමිණ සිටි බවට සාක්ෂි වශයෙන් ඔවුන් විසින් ඒ සාධන පත්‍රයෙහි තම නම් අත්සන් කළ යුතු ය. තව ද, මෙම අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකු විසින් අත්සන් කිරීමට පරිබාහිරව විය යුතු ය.

විසුරුවා හැරීමේ දී ඉතිරි වන දේපළ.

**12.** සංස්ථාව විසුරුවා හැරීමේ දී එහි සියලු ණය සහ බැරකම් පියවීමෙන් කවර හෝ දේපළක් ඉතිරි වුවහොත්, ඒ දේපළ සංස්ථාවේ සාමාජිකයන් අතර, බෙදනු නොලැබිය යුතු අතර, සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇත්තා වූ ද, ස්වකීය රීති අනුව, යම් දේපළක් හෝ යම් ආදායමක් ස්වකීය සාමාජිකයන් අතර බෙදීම තහනම් කර ඇත්තා වූ ද, වෙනත් යම් ආයතනයකට ඒ දේපළ දීම හෝ පැවරීම කරනු ලැබිය යුතු ය.

ජනරජයේ හා අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

**13.** මේ පනතේ සඳහන් තැනැත්තන්ගෙන් හා ඔවුන් මගින් ඔවුන්ගෙන් සහ ඔවුන් යටතේ, හිමිකම් පාන්නවුන්ගේ අයිතිවාසිකම්වලට හැර, ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙනත් තැනැත්තන්ගේ අයිතිවාසිකම්වලට මේ පනතේ ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**14.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 875 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළෙඹන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකි ය.